# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2148/56 - 2019 නොවැම්බර් මස 08 වැනි සිකුරාදා - 2019.11.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2129/96 සහ 2019.06.28 දාතම දරන**
***අති විශෙෂ ගැසට් පත්‍රයේ වැරදි නිවැරදි කිරීමේ දැන්වීමයි***

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අංක 2129/96 සහ 2019.06.28 දාතම දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 07 - 4555/11 දරන *ගැසට් නිවේදනය* මෙයින් නිවැරදි කරමි.

එකී *අති විශෙෂ ගැසට් නිවේදනයේ* පහළ කොටසේ ශීර්ෂයේ "කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශ" වෙනුවට "**කුරුණෑගල මහ නගර සභාව සහ කුරුණෑගල ප්‍රාදේශීය සභාව යන බල ප්‍රදේශයන්ගෙන් සමන්විත වන කුරුණෑගල නාගරික සංවර්ධන ප්‍රදේශය**" ලෙස යෙදීමෙන් ද, ඉහත කී *අති විශෙෂ ගැසට් නිවේදනයේ* පහළ කොටසේ අන්තර්ගතයෙහි "1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 "අ" වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශ" වෙනුවට "**1982 අංක 4 දරන පනතෙන් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 "අ" වගන්තියේ බලතල ප්‍රකාර කුරුණෑගල මහ නගර සභාව සහ කුරුණෑගල ප්‍රාදේශීය සභාව යන බල ප්‍රදේශයන්ගෙන් සමන්විත කුරුණෑගල නාගරික සංවර්ධන ප්‍රදේශය**" ලෙස ඇතුළත් කිරීමෙන් ද, පහත පරිදි නිවැරදි විය යුතුය.

***"කුරුණෑගල මහ නගර සභාව සහ කුරුණෑගල ප්‍රාදේශීය සභාව යන බල ප්‍රදේශයන්ගෙන් සමන්විත වන කුරුණෑගල නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම"***

"1982 අංක 4 දරන පනතෙන් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 "අ" වගන්තියේ බලතල ප්‍රකාර කුරුණෑගල මහ නගර සභාව සහ කුරුණෑගල ප්‍රාදේශීය සභාව යන බල ප්‍රදේශයන්ගෙන් සමන්විත කුරුණෑගල නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8"ඊ" වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019 ජූනි මස 28 වැනි දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි."

**ආචාර්ය ජගත් මුණසිංහ,**
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2019 නොවැම්බර් මස 07 වැනි දින.

1A - G 31438 - 19 (2019/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

අංක 2129/96 සහ 2019.06.28 දාතම දරන *ගැසට් පත්‍රයේ* 07-4555/11 දරන පූර්වගාමී *ගැසට් නිවේදනයෙහි* ප්‍රතිපාදනයන්හි කෙසේ සඳහන් වුවද, මෙහි ඉහත සඳහන් වරද නිවැරදි කිරීම අතීතයට බලපාන පරිදි බල පැවැත්විය යුතු අතර, 2019 ජුනි මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතුය.

**පාඨලී චම්පික රණවක,**
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 නොවැම්බර් මස 07 වැනි දින,
17 හා 18 වන මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල,

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

11 - 1488

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.